# කොවිඩ් දූන් අපූරු නිවාඩුව



ජනිත් කලණ දිසානායක

# කොවිඩ් දූන් අපූරු නිවාඩුව

කතෘ

## ජනිත් කලණ දිසානායක

චිත්‍ර සහ කෘතියේ අයිතිය

: ජනිත් කලණ දිසානායක

ISBN අංකය : 978-624-206-489-5

මුද්‍රිත දිනය : 2023-11-15

පාසල : වාරියපොල ශ්‍රී සුමංගල විදුහල

මහනුවර

Wondershare PDFelement

# පිදුම

මෙම පොත් පිංච මාගේ  පාසලේ විදුහල්පතිතුමාටත්,

පංතිභාර ගුරුභවතාටත්, ආදර දෙමාපියන්ටත්,

**මහනුවර මහාමයා බාලිකා විදුහලේ** (9 වසර C)

ඉගෙනුම ලබන මා දයාබර සහෝදරිය විතුල්යා උදාන්දිටත්,

**“දිවිය දිනන විද්‍යුත් පොතක්”** (E-Book) ව්‍යාපෘතියට

ග්‍රන්ථයක් රචනා කිරීමට අවස්ථාව ලබාදුන්

මහාමායා බාලිකාවේ විදුහල්පතිතුමිය ඇතුළු

මෙම ව්‍යාපෘතිය නිර්මාපක සෙනවිරත්න ගුරුතුමාටත්,

කාර්යය මණ්ඩලයේසියලු දෙනාටත් මෙම කෘතිය

ඉතා ආදරයෙන් පිළිගන්වමි ...........

Wondershare PDFelement

## ...පෙරවදන....

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකිම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකිමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# කොවිඩ් දුන් අපූරු නිවාඩුව

2019 වර්ෂයේ දෙසැම්බර් මස චීනයේ වුහාන් නගරයෙන් ආරම්භ වූ මෙම දරුණු කොවිඩ්19 වසංගතය ක්‍රමක් ක්‍රමයෙන් ලොවම වසා ගත්තේය. අපේ රටේ මෙම කුඩා දිවයින පුරාම මාර්තු මාසයේ මෙම වසංගතය ව්‍යාප්තවන්නට පටන් ගත්තේය. ක්‍රමයෙන් මෙම වසංගතය ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තවීමත් සමග අප කවුරුත් නො සිතූ පරිදි පාසල් ආර.ම්භ වූ මුල්ම වාරයේම අධ්‍යාපන කටයුතු ද පළමු පාසල් වාර විභාගය ද නිමා විය. පාසල් වැසීම නිසා අධ්‍යාපනයද කඩා වැටුනි. අප නිවෙස් තුලටම වී සිටීමට මෙම වසංගතය හුරු කරවීය. කෙසේ නමුත් මෙම කාලයේ මා ලද අත්දැකීම් මෙසේ ගොනු කර ලිවීමට මා කැමැති වුයේ එය මගේ ජීවිතයට ලද අපූරු අත්දැකීම් ගොන්නක් එක් කරවූ හෙයිනි.

අප කවුරුත් නො ඉවසිල්ලෙන් බලා සිටින අලුත් අවුරුද්ද වෙනදා මෙන්සුන්දර අත්දැකීමක් නොවුයේය. පරිසරයේ ගහකොළ ඊට සුදානම් වුවද අපට නම් එය එතරම් සුන්දර නොවිය. වෙනදා මෙන් යහලුවන් සමග එකතුව කිසිදු සෙල්ලමක් කිරීමට නොහැකිවිය. චාරිත්‍ර කිරීම නිවසේ සිටින සමාජිකයන් අතරටම සීමා විය.අසල්වැසියන් සමගකැවිලි පිගන් හුවමාරු කරගැනිම් යහලුවන් සමග සෙල්ලම් කිරීම මෙවර තහනම් විය. රජයෙන් දෙන ලද සෞඛ්‍ය උපදෙස් පිළිපැදිමට සිදුවිය. සීයා සහ අත්තම්මා ගේ නිවසට නොයැමත් පවුලේ සහෝදර සහෝදරියන් මුණ නොගැසීම සිනහ වෙන් සතුටින් කාලය ගත කිරීමට නොහැකි වීම වසංගතයේ මා ලද අමිහිරි අත්දැකීමක් විය. නමුත් වෙනදාට තාත්තා සතියකට වරක් ගෙදර පැමිණිම සිදු වුවද කොවිඩ් නිසා තාත්තා රැකියාවට නොගියේය. ඔහුත් සමග කාලය ගත කිරීමට ලැබීම මගේ සිතට මහත් සහනයක් හා ලොකු සතුටක් විය.

වෙනදාට අලුත් ඇදුම් ඇඳ පැළඳ නෑගම් යැමට ලැබීම විවිධ වූ රස කැවිලි වල රස බැලිමට නොහැකිවීමත් සහෝදරු සහෝදරියන් මුණ නොගැසිමට ලැබීමත් ඉතා දුකකි. කණගාටුදායක අවුරුද්දක් වුවත් කොවිඩ් දුන් අපූරු නිවාඩුව නිසා ගෙදර සියල්ලන්ම සමග එකතුව සටීමට ලැබීමත් ඔවුන් සමග කාලය ගත කිරීමට ලැබීමත් එක් අතකින් සතුටට කරුණකි. අලුත් අවුරුදු කැවිලි මේසයේ නිවසේ සියලු දෙනාම සිටී.

Wondershare PDFelement

ඇතැම් අවුරුදු නිවාඩුවට තාත්තා ගෙදර නොසිටියේය ඒ රැකියාව නිසා ය. මෙවර සියලු චාරිත්‍ර පවුලේ සියලු දෙනා සමග සිදු කිරීමත් මහත් සතුටකි.

බෞද්ධ ආගමික ජනතාවගේ විශේෂ දිනයක් වු වෙසක් පුන් පොහෝ දිනය ද නිවසටම සීමා විය. වෙනදා මෙන් සැදැවතුන්ගෙන් බෞද්ධ වෙහෙර විහාර පිරි ඉතිරි නොගියේය.වෙසක් තොරණ් බලමින් දන්සැල් වලට යමින් සියල්ලෝම සතුටින් වෙසක් කුඩු නැරඹීමක් ද මෙවර නොවීය. ගමේ යහලුවන් සමග එකතුව උදෑසන සිට ගමේ ඇවිද උණ කුරු සොයමින් කපමින් කවටකම් කරමින් වෙනදා මෙන් සාදන ලෙකු වෙසක් කුඩුව මෙවර සැදිමට අවස්ථාවක් නොමැති විය. තනිව නිවසට වී වෙසක් කුඩු සාදා එහි ලස්සන බැලිමට සිදුවිය. යහලුවන් සැදූ වෙසක් කුඩු මෙවර දැක ගත හැකි වුයේ whats app මගිනි එය එතරම් රසවත් නොවුයේ ය. මෙවර මාගේ වෙසක් කුඩුව තරමක් වෙනසක් විය එනම් තාත්තා මා සමග එකතුව කැටයම් කපා නිම කළ වෙසක් කුඩුවක් සාදා දිමට උපකාර කළ බැවිනි. එය මට නව අත්දැකිමක් විය. විවිධ මෝස්තරයන් යොදා ගනිමින් අටපට්ටමට වෙනස් වු රටාවකට වෙසක් කුඩුව නිර්මාණය වීමයි.

අප ගමේ විහාරයේ සෑම වසරකම කඨින මහා පිංකම මහත් උත්කර්ෂවත් අයුරින් පැවැත්වෙන නමුත් මෙවර එයද සිදු නොවුයේ ය. උදෑසන සිට සාදු නදින් යහලුවන් සමග පයින් මුලු ගම වටේම ඇවිද යාමට නොහැකිවීම මහත් කණගාටුවකි. සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් සීමිත පිරිසකට ඒ සඳහා සහභාගි වීමට අවස්ථාව ලැබුනි.

Wondershare PDFelement



මෙම කාලයේ පාසල් ආරම්භවීමක් සිදු නොවුවද අප පාසලේ සිසුන්ගේ අධ්‍යාපන මට්ටම නගා සිටු වීමට විදුහල්පතිතුමන් ඇතුලු ගුරු භවතුන් හා අනෙකුත් කාර්යය මණ්ඩල සහායකයින්ද නොමසුරුව තම වෙහෙස නොතකා එය නගා සිටුවීමට ක්‍රියා කළේය. විදුහල්පතිතුමන්ගේ මග පෙන්වීම යටතේ ගුරු මණ්ඩලය නව තාක්‍ෂණික ක්‍රම වේදයන් භාවිතා කරමින් ඔවුන්ට හැකි උපරිම අයුරින් දරුවන් සම්බන්ධ කර ගනිමින් ඉගැන්වීමට වෙහෙස වෙන ලදි. දෙමාපිය දැනුවත්කිරීම මත සිසු සහභාගිත්වය ඉහළ නංවන ලදි. සකස් කරගත් කාලසටහනකට අනුව විවිධ වු විෂයයන් ඉගැන්වීම කරන ලදි. එමෙන්ම රූපවාහිනිය ඔස්සේද නැරඹීමට ද අවස්ථාවක් ලැබිනි.

මෙය මට නව අත්දැකිමක් විය. මේතුලින් මා හට ජංගම දුරකතනය පරිගණකය වැනි විද්‍යුත් මාධ්‍ය හසුරුවා ගැනීමට අවබෝධයක් ලැබුනි. දුරකතනයේ whats app, Zoom වැනි නව ක්‍රමවේදයන් භාවිතා කරමින් අධ්‍යාපන වැඩසටහන් වලට සම්බන්ධ වීමට ලැබීමත් ඒ පිළිබඳ අන්තර්ජාල භාවිතා කරමින් වැඩි විස්තර සොයා බැලීමට හැකියාව ලැබීමත් වන අත්දැකීමක් විය.



පවුලේ සහෝදර සහෝදරියන් සමග එකතුවී මෙම තාක්‍ෂණය ඔස්සේ ඔවුන්ගේ තොරතුරුද රටේ පවතින තත්වයන්ද වටහා ගැනිමටත් නිරන්තර විමසිලිමත්ව කටයුතු කිරිමට හුරුවීම නව අත්දැකිමක් විය. වෙනදාට වඩා වැඩි සැලකිල්ලකින් නිරන්තරයෙන් සෞඛ්‍ය පුරුදු කෙරේ උනන්දුවීමත් නව අත්දැකිමකි. විවිධ වු රෝගයන්ට ඔරොත්තු දිමට කටයුතු කරන්නේ කෙසේද ගත යුතු ආහාර රටාවන් පිළිබඳවත් දැනුවත් වීමි. එසේම විවිධ මාධ්‍ය ඔස්සේ නව තොරතුරු සෙවීමට මෙම කාලය යොදා ගතිමි.

නිවසේදි කාලය ගත කිරිමෙන් පුවත්පත් කියවීම පොත්පත් කියවීම වගේම විද්‍යා පර්යේෂණ කටයුතු සිදු කිරිමට මාහට ඉඩකඩ ලැබුනි පාසලෙන් ලද දැනුම නිරික්‍ෂණය සඳහා යොමු කිරිමට හැකියාව ලැබුනි පරිසරයේ විවිධ වු සතුන්ගේ චර්යාවන් සැබැවින්ද දැක ගැනිමට හැකිවිය මෙය ඉතා සුන්දර අත්දැකිමක් විය. කුරුල්ලන් එකිනෙකාගේ හඬ තරගයකට සින්දු කියන්නාක් මෙන් විය. සුදු රෙදි හොරා ගැන මා අසා තිබුනද ඌව දැකගැනිමට හැකිවුයේ මෙම නිවාඩු කාලයේය. තනි සුදු පැහැයෙන් යුක්ත වු ඌට දිගු සුදු පැහැති වලිගයක් විය. දඩු ලේනුන් ගස්වල එහා මෙහා පනමින් ගෙඩි කමින් සිටින අයුරු මා පින්තුර ගත්තෙමි. මල් කවුඩන් කහ කුරුල්ලන් වැනි සතුන්ද විවිධ වු සමනලයින් වර්ග පිළිබඳ සොයා බැලිමට ද දැක ගැනිමටද මට කාලය ඉතිරි විය. මේ සඳහා අම්මා තාත්තා මට උපකාර කළේය. ඔවුන් දන්නා තොරතුරු ද මාහට කියා දුන්නේය.

කොවිඩ් මාරයා ඔහුගේ ගමන යද්දි මා නිවසටම වී අපේ අම්මාගේ හා තාත්තාගේ ගෙවතු වගාවට හවුල් වීමට මට අවස්ථාව ලැබුනි. විවිධ වර්ගයේ එළවලු වර්ග වගා කිරිමට පමණක් නොව සියැසින්ම ඒවායේ වර්ධනය දැක ගැනිමට හැකි වීම මහත් සතුටකි. තාත්තාගේ උපදෙස් මත මා විසින් සකස් කරන ලද කොම්පෝස්ට පොහොරින් සතියක පමණ කාලයකට පසු එම සාරවත් පස් වගාවට එකතු කිරිම සිදු කරන ලදි.

සැමදා වටපිට අතු ගා එකතුවන කොළ රොඩු කුස්සියේ ඉවතලන එළවලු පළතුරු කොටස් ආහාර කොටස් එයට එකතු කොට එකතු වන කලු සාරවත් පස් වගාවට ඉතා සුදුසු බව ගුරුතුමී කියා දුන් පාඩම මට සිහිවිය. සවස් වන තෙක් මා බලාසිටියේ නොඉවසිල්ලෙනි.

මන්ද මා විසින් සිට වු පැළ වලට තාත්තා විසින් සකසා දුන් ඉවතලන සැමන් ටින් මල් බඳුනින් ජලය සෙමෙන් සෙමෙන් දැමීමට ය. පුංචි බීජ පැළ වු විට තවානෙන්

ගලවා වලවල් කපා සරු පස් එකතු කොට වැවූ වගාවන් ගේ පලදාව නෙලීමට මා උවමනාවෙන් බලා සිටින්නෙමි. ගෙවතු වගාවක් කිරීම ඇත්තෙන්ම මහත් ආශාවක් සතුටක් සිතට ගෙනදෙන්නකි. දවසින් දවස කුඩා පැළ ලොකු වනවිට එහි මලක් ගෙඩියක් එන විට සිතට දැනෙන සතුට අත් විඳියම යුතුය.



සමහර දිනවල තාත්තා හා අම්මා සමග එකතුව උදෑසන කාලයේම ගෙවත්තේ ගතකළෙමි. ගෙවත්තෙන් නෙළා ගන්නා පළා වර්ග ආහාරයට ගැනිමේදි ඉන් නැවුම් රසයක් ඇත්තේය. පාසලේදි ලත් දැනුමින් ඉවත ලන බඳුන් වගාවද කිරීමට ද මෙම කාලය තුළ හැකියාව ලැබුනි. එසේම වගාවට හානි කරන පරිබෝධකයින් මැඩ පැවැත්වීමට අවශ්‍ය පාසලින් ලද දැනුම ද මා මෙහිදි ප්‍රයෝජනයට ගත්තෙමි.

මා අම්මා සමග එකතුව ඖෂධ පැළ එකතුවක් සකස් කළෙමි. කෝමාරිකා, පොල්පලා, කහ, කුරුඳු පැළ ඊට එකතු කළේය. සිටවූ පැළ ක්‍රමයෙන්

වර්ධනය වීම බලා ගැනිමට හැකිවුයේ එම අත්දැකිම් ලබා ගැනිමට හැකි වුයේ කොවිඩ් දුන් දිගු නිවාඩුව නිසාය.

අත්තා සමග විවේකිව සිටින මොහොතක කතා කළ මා හට දැන ගැනිමට හැකිවුයේ ඔවුන්ගේ කාලයේද මෙවැනිම වසංගතයක් පැමිණි අතර ඔවුන් එයට මුහුණ දුන් ආකාරයයි. එයදමා ජීවිතයට රසබර අත්දැකිම් එකතු කළේය. ඉස්සර මිනිසුන් ගත් කෑම වර්ග ආහාර රටාව අත්තාගේ පීවිතයේ අත්තා කළ කි දේ ආදි බෝ කරුණු ඔහු මට කියා දුන්නේය. ඔහු කොසු ඉදල් හැඳි සකස් කිරිමට දන්නෙහිය. මෙම නිවාඩු කාලයේදි අත්තා සමග එකතුවී ඔහුගේ එම කටයුතු සඳහා මා සහාය වුයෙමි. ඔහු මට ඒවා සකස් කර ගන්නා අයුරු කියා දුන්නේය. කොළපතක් පිරිසුදු කොට ඒ මත මට හිඳ ගැනිමට පවසා ඇදගෙන යාම ඉතා විනෝදජනකය.

අපි ජිවත් වන ගමේ නම වේගිරියයි. එම නම ගමට සකස් වු හැටි කතාන්දරය මා දැනගත්තේ අත්තාගෙනි. ගමට ආසන්නව තිබෙන ඇම්බැක්ක දේවාලය පිළිබඳ ඓතිහාසික කතා පුවත ද මා ඔහුගෙන් අසා දැනගත්තෙමි. කොවිඩ් දුන් නිවාඩුව නිවසේම නිවැසියන් සමග ඉතා සමීපව සිටීමට අවස්ථාව ලද නිසා නව අත්දැකිම් හා නව සිතුවිලි මගේ ජිවිතයට එකතු විය.

අම්මා තාත්තා සමග එකතුවී රාත්‍රී ආහාරය සකස් කිරිමට උදව් කිරිමෙන් ඉවුම් පිහුම් පිළිබඳවද සරල අවබෝධයක් ලැබුනි. මා අතින් සකස් කර දෙන ලද තේ කෝප්පයක රස බලා තාත්තා කිවේ “හරි හොඳයි” කියාය. කෙසේ හෝ පරිප්පු ව්‍යාංජනයක් සම්බෝලයක් තේ එකක් සකසා ගැනිමට අද මට හැකියාවක් ඇත. ගෙදර සියල්ලෝම සමග එකතුවී ආහාර පිසිමටත් විවිධ වු ආහාර වර්ග සැකසීමට හා රස බැලීමට අම්මාට උදව් කිරිමට ලැබීම මට මහත් සතුටකි. පොල් ගෑම එලවලු කැපිම භාජන පිරිසුදු කර ඒවා පිළිවෙලට අස් කිරිම ආදි මුලු තැන් ගෙහි කළයුතු කාර්යයයන් පිළිබඳ අවබෝධයක් අම්මාට උදව් කිරීම නිසා ලබා ගත්තෙමි.

මා කොවිඩ් නිවාඩුවේදි කුඩා කළ සිට කියවු කතන්දර පොත් එකතු කොට කුඩා පුස්තකාලයක් සකස් කර ගත්තෙමි. පොත් රාක්කයක් නොතිබුනද තාත්තා කිවේ පසු දිනක ඒය සකසා දෙන බවයි. වෘත්තියෙන් ගුරුවරියක වු අම්මා මා කියවු පොත් සියල්ල එකතු කර තබා තිබීම මට පුස්තකාලය සකසා ගැනිමට උදව් විය. ඇතැම්

පොත් මා නැවත කියවා බැලුවෙමි. ඇත්තෙන්ම ඒවා යේ කතා බොහෝ රසවත්ය. කුඩා කතන්දර වුවත් දෙන උපදේශ ඉතා වැදගත් විය. ඉංග්‍රීසි කතන්දර පොත් ද මා පුස්තකාලය සතුව පවති. දැනුම වර්ධනයට අවශ්‍ය සාමාන්‍ය දැනිම පොත් ද මෙහි වේ. කියවීමෙන් ඇත්තෙන්ම දැනුම සතුට දුක ත්‍රාසය වර්ධනය වන බව සැබෑවකි. හීන් සැරය, හත්පණ මා ආසා කළ කතන්දරය.

ලද නිවාඩු කාලයේ උදෑසන සිට යම් යම් කාර්යයන් සඳහා යොමු වෙමින් දෙමාපියන් සමග නිවසින් බැහැරට නොගියද ගත කළ කාලය ඉතා මිහිරි අත්දැකීම් මා ජීවිතයට එකතු කළේය. තාත්තා සාදාදුන් සරුංගලයද මා සාදන සරුංගයට වඩා මදක් විශාල වුවකි. එය ගෙන නියර දිගේ ඔහු සමග කුඹුරට ගොස් සරුංගල් යැවුයේ මෙවර මා තනිවමය. වෙනදා මෙන් ඒවා තරගයට යැවීමටත් කිසිවකුත් නොවීය. තාත්තා ඔහුගේ පාසල් කාලයේ කළ කී දේ මිතුරන් සමග එකතුව ගමේ ඇවිද කළ සෙල්ලම් මාහට කියා දුන්නේය. එතරම් ම සොදුරු වු කාලයක් අප හට නොමැති වුවත් කොවිඩ් දුන් නිවාඩුව මට තාත්තා සමග ගත කිරීමට ලැබීම සතුටුය.



ඇතැම් දිනවලදි දහවල් වැඩ අවසන් වු පසු අම්මා තාත්තා මා ගීත ගායනා කරමින් විනෝද වුයෙමු. ඔවුන්ගේ ළමා කාලයේ සිදුවීම මෙන්ම වර්තමාන ලෝකයට මුහුණ දිමට අවශ්‍ය මග පෙන්වීම් ඔවදන් ලබා දුන්නේය. මා හට විවිධ ගිත වර්ග සොයා දෙමින් වයලිනය වාදනයට උනන්දු කළේය. ඉන් මා පාසලේ  දුන් අභ්‍යාස කිරීමටත් සොයා ගන්නා ලද විවිධ වු ස්වර අභ්‍යාසයන්හි නිරත වීමටත් උනන්දු වු අතර අම්මාට හා තාත්තාට රස වින්දනයට ගිත වැයිමට හුරු වුයෙමි. දිගු නිවාඩු කාලයක් බැවින් වයන ලද විවිධ වු ස්වර ගිත දරකතනය ඔස්සේ බලගොල්ලේ අත්තම්මා හා සියාට ඇසිමට මා සැලැස්වුයෙමි. ඔවුන්ගේ ඇගයිම මට මහත් සතුටක් විය.

මෙම නිවාඩුවින් මා ලද තවත් අත්දැකිමක් නම් අප හට ලද සෑම විවේක කාලයක්ම අප අපට වැදගත් වන අයුරින් භාවිතයට ගතහොත් අපගේ ජිවිත සාර්ථක වන බවයි.  එන සෑම බාධකයක්ද සතුටින් විඳගෙන එයට ගැලපෙන ලෙස මුහුණු දිමට ශක්තිය ධෛර්යය ගෙන කටයුතු කිරීමයි.

කොවිඩ් නිවාඩුව කෙසේ හෝ මා හට නම් විවිධ වු අත්දැකිම් සමුදායක් ලබා දුන්නේය. මෙම වසංගතය නිසා ලබා දුන් නිවාඩුව ඵලදායි ලෙස මා ගත කළායැයි මා හට හැගේ. වැඩිහිටියන්ගෙන් අපට ලබා ගත හැකි අත්දැකිම් බෝහෝය. එමෙන්ම අවවාද උපදෙස්  කියා නිම කළ නොහැක. ඔවුන් ලබා දෙන මේ සියල්ල මාගේ ජිවිතය සාර්ථක කර ගැනිමට මා හට ඉවහල් වේයැයි මා සිතමි.

නිමි.

Wondershare PDFelement



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක


2023 . 11 . 01